# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1904/31 - 2015 මාර්තු මස 04 වැනි බදාදා - 2015.03.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා විගණන සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 2 ඡේදය හා 3 ඡේදය සංශෝධනය කිරීම

1989 දෙසැම්බර් මස 11 දිනැති අංක 588/5 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත්කර ඇති අංක 993/17 හා 1997 සැප්තැම්බර් මස 19 දිනැති සහ අංක 1056/23 - 1998 දෙසැම්බර් 04 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍ර* මගින් සංශෝධිත, ශ්‍රී ලංකා විගණන සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 2 ඡේදය හා 3 ඡේදය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සංශෝධනය කරන ලදුව සංශෝධිත ඡේද දැනගැනීම සඳහා පළ කරනු ලැබේ.

මෙම සංශෝධනය *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දිනයේ සිට ක්‍රියාත්මක වනු ඇත.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න,
*වැඩබලන විගණකාධිපති.*

2015 මාර්තු මස 04 වැනි දින,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
බත්තරමුල්ල.

ශ්‍රී ලංකා විගණන සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 2 ඡේදය හා 3 ඡේදය සංශෝධනය කිරීම

1989 දෙසැම්බර් මස 11 දිනැති අංක 588/5 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත්කර අංක 993/17 හා 1997 සැප්තැම්බර් මස 19 දිනැති සහ අංක 1056/23 - 1998 දෙසැම්බර් මස 04 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් සංශෝධිත, ශ්‍රී ලංකා විගණන සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 2 ඡේදය හා 3 ඡේදය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සංශෝධනය කරන ලදුව සංශෝධිත ඡේද දැනගැනීම සඳහා පළ කරනු ලැබේ.

2(I) ඡේදයේ 1 පන්තියට ඉහළින්
"විශේෂ ශ්‍රේණිය - වාර්ෂික වැටුප් පරිමාණය රු. 508,680-12x15,720-697,320 " යන්න ඇතුළත් කිරීම
2(II) ඡේදයේ අනුමත සේවක සංඛ්‍යාව යටතේ 1 පංතිය යන්නට ඉහළින්
"විශේෂ ශ්‍රේණිය තනතුරු 03 "
(අතිරේක විගණකාධිපති)
යන්න ඇතුළත් කිරීමටත්,

3(I) ඡේදයට ඉහළින් නව 3(I) ඡේදයක් ඇතුළත් කිරීම.

1A - G 21112 — 05 (2015/03)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3(I) ශ්‍රී ලංකා විගණන සේවයේ I පන්තියේ I ශ්‍රේණියේ නියෝජ්‍ය විගණකාධිපතිවරුන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම

(අ) සපුරාලිය යුතු සුදුසුකම්.

පහත අවශ්‍යතා සම්පූර්ණ කරනු ලැබූ සේවයේ I පන්තියේ I ශ්‍රේණියේ නිලධාරීන් උසස් කිරීම මගින් පමණක් සේවයේ විශේෂ ශ්‍රේණියේ පුරප්පාඩුවලට උසස් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරනු ලැබේ.

i. ගණකාධිකරණය හෝ විගණනය හෝ (විෂය ක්ෂේත්‍රයක් හෝ විෂයයක් හෝ සහිතව) පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක්/ආයතනයක් වෙතින් පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය හෝ එංගලන්තය සහ වේල්ස්හි වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය හෝ එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනය හෝ එක්සත් රාජධානියේ සහතික ලත් වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම.

ii. උසස්වීම් සඳහා සුදුසුකම් ලබන දිනට ශ්‍රී ලංකා විගණන සේවයේ I පන්තියේ වසර පහ (5)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා I පන්තියට උසස් කිරීමෙන් පසු වැටුප් වර්ධක පහ (05)ක් උපයා ගෙන තිබීම.

iii. උසස්වීම් සඳහා සුදුසුකම් ලබන දිනට සුදුසුකම් ලබන ශ්‍රී ලංකා විගණන සේවයේ විධායක ශ්‍රේණියේ වසර 18කට නොඅඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(ශ්‍රී ලංකා විගණන සේවයේ 1 පන්තියට සෘජුව බඳවාගත් නිලධාරීන් සම්බන්ධයෙන් මෙම වගන්තිය අදාළ නොවේ.)

iv. උසස්වීම් සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්න වසර පහ (5)ක් තුළ වාර්ෂික කාර්ය සාධනය සතුටුදායක හෝ ඉහල මට්ටමක පැවතීම.

v. උසස්වීම් සඳහා සුදුසුකම් ලබන දිනට 1 පන්තියේ වසර පහ (05)ක සතුටුදායක සේවා කාලයක් තිබීම හා විනයානුකූල දඬුවමකට ලක් නොවී තිබීම.

(ආ) උසස් කිරීමේ ක්‍රමය

ශ්‍රී ලංකා විගණන සේවයේ 1 පන්තියේ 1 ශ්‍රේණියේ නියෝජ්‍ය විගණකාධිපතිවරුන් උසස් කිරීම මගින් පමණක් සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ. ඉහත දක්වා ඇති සුදුසුකම් සියල්ල සපුරාලන නිලධාරීන් පුරප්පාඩු අනුව ජ්‍යෙෂ්ඨතාවය මත ශ්‍රී ලංකා විගණන සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

(ඇ) අතිරේක විගණකාධිපති තනතුරුවලට පත් කිරීම

ශ්‍රී ලංකා විගණන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් නියෝජ්‍ය විගණකාධිපති තනතුරක සේවය කරන ලද ජ්‍යෙෂ්ඨතම නිලධාරීන්ට රාජ්‍ය සේවා කොමිෂම විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක නිර්දේශ මත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තනතුරේ පවතින පුරප්පාඩු අනුව අතිරේක විගණකාධිපති තනතුරුවලට පත් කරනු ලැබේ.

3(I) ඡේදය ලෙස අළුතින් ඡේදයක් එකතු වීම නිසා දැනට සේවා ව්‍යවස්ථාවේ 3(I), (II) හා (III) ඡේද අනු අංක පිළිවෙලින් 3(II), (III), (IV) ලෙස සංශෝධනය කිරීම.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න,
වැඩබලන විගණකාධිපති.

03-482

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.